පොත් බාරදීපු තැනට ගිහිල්ලා පොත ගැන ඇහුවා. බලනකොට පොත් පාර්සලය ගෙනත් දීපු විදිහටම මුල්ලක තියනවා. මේකට හේතුව මම දැනගත්තේ පස්සේ. පොත විකුනගන්න ඕනේ නම් එතන ඉන්න කීප දෙනෙකුට සන්තෝෂම් දෙන්න ඕනෙලු. එහෙම දුන්නම තමයි පොත රාක්කවල ජේන විදිහට තියලා, කඩේට එන අයට මෙන්න අලුත් පොතක් ඇවිල්ලා කියලා පෙන්නලා විකුණන්නේ. නැත්නම් පොත ගෙනත් දීපු තැනම තමයි, පස්සේ මම දයාවංශ ජයකොඩි සාප්පුවට ගිහිල්ලා පොත ගැන කිව්වාම පොත් 250ක් ගේන්න කියලා කිව්වා. පොත් මිටියක් එතනටත් ගිහිල්ලා දීලා මම ආපහු මාතර ගියා. සති දෙකක් යනකොට මට ඕවුමක් ලැබුණා ඒ පොත් ටික විකිණිලා අවසානයි තවත් පොත් 250ක් ගේන්න කියලා. එතනින් තමයි දයාවංශ ජයකොඩි සමාගමත් එක්ක මගේ ගනුදෙනුව ඇරඹුණේ. මේ වෙනකොට මගේ පොත් 60න් 42ක්ම මුද්‍රණය කරලා තියෙන්නේ දයාවංශ ජයකොඩි සමාගමෙන්.

පොත් 'දොරට වැඩීම' අලුත් ක්‍රමේට කියනව

උරුමාලය
කර්තෘ-ජයකොඩි සෙනෙවිරත්න
ප්‍රකාශනය-2012 ජනවාරි
මුද්‍රණය-දයාවංශ ජයකොඩි සහ සමාගම
මිල: රු 290/-

නම් 'ජනගත කිරීම' ලේඛකයන්ගේ නව ප්‍රවණතාවයක් වෙලා තියනවා. ඒ ගැන ඔබේ ආකල්පය මොකක්ද?

සමහරු පොත් දොරට වැඩීම වැඩකට නැති දෙයක් කියලා විවේචනය කරනවා. ඒ විවේචනවල යම් සත්‍යයක් තියනවා. ඒත් පොත් දොරට වැඩීමේ උත්සව පවත්වන එක නොකළ යුතු දෙයක් කියලා මම කියන්නේ නෑ. මොකද ලේඛකයෙකුට තමන්ගේ පොත ගැන කිසියම් පුංචි හෝ ප්‍රසිද්ධියක් ලබාගන්න අද තියන එකම අවස්ථාව මේ දොරට වැඩීමේ උත්සවය විතරයි.

දයාවංශ ජයකොඩි මහත්තයා කතා කරලා පහුගිය කාලේ ස්වාධීන රූපවාහිනියේ පුංචි ඉඩක් ලබාගෙන තිබුණා පොතක් දොරට වඩින උත්සවයක් තියන දවසට ඒ ගැන ස්පොට් එකක් දාන්න. අහවල් ලේඛකයාගේ, අහවල් පොත, මෙන්න මේ දවසේ, මේ වෙලාවට, අහවල් තැනදී දොරට වඩිනවා කියලා. මාස කීපයක් ඕක කෙරිගන යනකොට ස්වාධීන රූපවාහිනියේ පාලකයෝ කියලා තියනවා තත්පර පහළොවකට වැඩිය යන කිසිම දෙයක් මුදල් අයනොකර දාන්න එපා කියලා. අද ලංකාවේ ලේඛකයෙකුට පුළුවන්ද පොතක් දොරට වඩිනවා කියලා මුදල් ගෙවලා ඒ විදිහට රූපවාහිනි දැන්වීමක් දාන්න. ඉතිං ඒ වැඩේ එහෙමම නැවතුනා. ආණ්ඩුවේ රූපවාහිනිය සාහිත්‍යයට ඔහොම සලකනකොට අනික් ඒවා ගැන කවර කතාද?

එතකොට සාහිත්‍ය සම්මාන ප්‍රදානය ගැන මොනවගේ අදහසක්ද දරන්නේ?

සම්මාන ප්‍රදානය කිරීම හොඳ දෙයක්. එක් අවුරුද්දක මගේ නවකතාවකටත් රාජ්‍ය සාහිත්‍ය සම්මානයක් ලැබුණා. ඒත් සම්මානයක් ලැබුන පමණින් ඒ නවකතාව හොඳ රසවත් එකක් වෙනවා කියලා කියන්න අමාරුයි. ගිය අවුරුද්දේ සාහිත්‍ය සම්මාන ලැබුව නවකතාවක් කියවන්න කියලා මම පහුගිය දවසක අතට ගත්තා. කීප සැරයක්ම කියවන්න උත්සාහ කරා. මිනු. කිසිම ආශාවක් ඇතිවෙන්නේ නෑ කියවන්න. පස්සේ පැත්තකට දාළ හිකත් හිටියා. හැබැයි මට ඒක එහෙම වුණාට තව කෙනෙකුට ආශාවෙන් කියවන්න පුළුවන් වෙන්නත් පුළුවන්. එක එක්කෙනාගේ රුචිය වෙනස් නේ. ඒ කොහොම වුණත් සාහිත්‍යයට තැනක් නැති මේ වගේ කාලෙක ඒ ගැන සමාජයේ යම් අවධානයක් යොමුකරවන්න වගේම ලියන අය දිරි ගන්වන්නත් මේ සම්මාන දීම උදව්වෙනවා. ඒ නිසා සාහිත්‍ය සම්මාන දෙන එක හොඳ දෙයක්.

ඔබගේ නවකතා වලින් නිර්මාණය වුණ චිත්‍රපටි, ටෙලි නාට්‍ය මොනවාද?

'මිහිදුම් සළු' කියන මගේ නවකතාවෙන් මීට කාලෙකට ඉස්සෙල්ලා සුනිල් ආරියරත්න චිත්‍රපටියක් කළා. ඒකේ තිර රචනය කළේ මම. චිත්‍රපටි සංස්ථාවේ තිර රචනා පාඨමාලාව සම්පූර්ණ කරාට පස්සේ තමයි මම මේ තිර රචනය කළේ. තිර රචනය කියවලා සුනිල් ආරියරත්න මගෙන් ඇහුවා තිස්ස අබේසේකරට පෙන්නලා මේකේ අඩුපාඩු තියනවා නම් හදාගත්තට කමක් නැත්ද කියලා. මම ඒකට බොහොම කැමති වුණා. මොකද තිස්ස අබේසේකර ඒ වෙනකොටත් තිර රචනයේ ප්‍රවීණයෙක්. චිත්‍රපටිය නිෂ්පාදනය කළේ ඒ විදිහට තිස්ස සංශෝධනය කරපු පිටපතෙන්. ඒකෙදි පොතේ අවසානය චිත්‍රපටියේ මුලට අරගෙන තිබුණා. ඒ නිසාද මං දන්නේ නෑ චිත්‍රපටිය ඒ තරම් සාර්ථක වුණේ නෑ.

දීර්ඝ කාලයක් කාර්යබහුල ජීවිතයක් ගෙවලා දැන් කොහොමද ජීවිතයේ සැදෑ සමය ගෙවෙන්නේ?

රස්සාවෙන් විශ්‍රාම ගියාට පස්සේ කලින් තිබුණට වැඩිය නිදහසක් දැන් තියනවා. ඒත් හැමදාම වගේ උදේ වරුවට නම් මොනව මොනව හරි වැඩ තියනවා. එක්කෝ සාහිත්‍ය උත්සවයක දේශණයක්. එක්කෝ ඉස්කෝලෙක තෑගි ප්‍රධානයක්. දහම් පාසලක කතාවක්. ඔය වගේ සාහිත්‍යයට සම්බන්ද මොනවා හරි දෙයක් තියනවා. ඒවාට ගිහිල්ලා ගෙදර එනකොට හවස් වෙනවා. ඊට පස්සේ තමයි පොත් පත්තර කියවන එකට, මොනව හරි ලියන එකකට ඉඩක් ලැබෙන්නේ.

සියලුම ජෝතිශ්‍ය කටයුතු

දෙසේ විදෙසේ කේන්ද්‍ර සෑදීම, පලාපල ලියා දීම,
කරදර ගැටළු වලට පිළියම්, අපල වලට පිළියම් හා වාර්තා.....
විවාහ සීනුම්, පොරොන්දම් ගැලපීම, දෝෂ විමසීම හා මගහරවා ගැනීමට උපදෙස්.....
මංගල, මල්වර, නිවාස, විභාග, අකුරු කරවීමේ ශුභ නැකත්.....
නමට අකුරු, නම් තැබීම....
දළ, සිරිපති, ත්‍රිෂ්ණාමූර්ති හෝ ඕනෑම ක්‍රමයකට කර දෙන්නෙමු.

ඊ මේල්, දුරකතන මගින් විශේෂ කඩිනම් සේවා.....

රහස්‍යභාවය සුරකිමු

සුබෝධා ජෝතිශ්‍ය සේවය

www.subodha-inc.com.au
0420682644/ 0433536097
subodha.inc@email.com

දිස්ත්‍රික්ක පදනම සහ සුරංජිකා අක්කා

මා පාසල් අධ්‍යාපනය ඇරඹුවේ කො/උ ශ්‍රී ශීලානන්ද කණිෂ්ඨ විද්‍යාලයෙනි. මෙහි කො/උ යන්නෙන් අදහස් වූයේ කොළඹ උතුර යන්නයි. ඒ අපේ පාසල අයිති වූ අධ්‍යාපන කොට්ඨාශයයි. එමගින් එවකට පැවති කොළඹ දිස්ත්‍රික්කයේ කැලණි ගඟෙන් උතුරේ කොටස නියෝජනය විය. කොළඹ ආනන්දයට යාමට පෙර හයවන ශ්‍රේණියේ සිට නමවෙනි ශ්‍රේණිය දක්වා මා ඉගෙනුම ලැබූ ගලගිටියාව මධ්‍ය විද්‍යාලය අයත් වූයේ ද ඒ අනුව කොළඹ දිස්ත්‍රික්කයට ය.

මා දන්නා පරිදි වසර 1975 පමණ කාලයේ දී සිට විශ්ව විද්‍යාලයට සිසුන් බඳවා ගැනීමේදී එයින් සියයට පනහක පමණ ප්‍රමාණයක් එක් එක් දිස්ත්‍රික්කයෙන් විභාගයට පෙනී සිටි සිසුන් ගණනේ අනුපාතයට අනුව තෝරා ගැණුනි. මෙය හැඳින්වූයේ දිස්ත්‍රික්ක පදනම නමිනි. මුළු දිවයිනේ ම ඉහළින් ලකුණු ලබාගන්නා සිසුන් අතරින් ඒ ලකුණු මත විශ්ව විද්‍යාල සඳහා තෝරාගත්තේ සියයට තිහක් පමණි. ඉතිරි සියයට විස්සක ප්‍රමාණය දුෂ්කර ප්‍රදේශ යැයි නම් කෙරුණු මුලතිවු, හම්බන්තොට, නුවරඑළිය ආදී දිස්ත්‍රික්කවලට වෙන් කර තිබුණි.

මේ දිස්ත්‍රික් පදනම නිසා එකම විශ්ව විද්‍යාල පාඨමාලාව සඳහා එක් එක් දිස්ත්‍රික්කවලින් ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණයේ සැලකිය යුතු වෙනස්කම් ඇතිවිය. ඒ විෂමතාව, ඒ ඒ දිස්ත්‍රික්කවල අධ්‍යාපන මට්ටම කියවෙන ව්‍යාප්ත නිර්ණායකයක් ලෙසද සැළකිය හැකිවිය.

මා පෙර කී පරිදි, ඒ කාලයේ ගම්පහ, මීගමුව කැලණි ගඟෙන් උතුරු ප්‍රදේශ ද අයත් වූයේ කොළඹ දිස්ත්‍රික්කයටම නිසා, මෙකී දිස්ත්‍රික් පදනමේ අවසන් ප්‍රතිඵලය වූයේ, කොළඹ සුපිරි පාසල්වල සිසුන් ද, ගම්පහ ප්‍රදේශයේ මධ්‍ය විද්‍යාලවල සිසුන් ද විශ්ව විද්‍යාල තේරීම් පටිපාටියේ දී එකම මට්ටමක ලා සැළකීමයි. වෙනත් වචනවලින් කිවහොත්, කොළඹ පාසලක සිසුවෙකු ද, ගම්පහ පාසලක සිසුවෙකු ද, එකම විශ්ව විද්‍යාල පාඨමාලාව හැදෑරීම සඳහා ලබාගත යුතු ලකුණු ප්‍රමාණය එක හා සමාන විය.

මා ආනන්දයේ ඉගෙනුම අරඹා වසරක් පමණ ගතවූ පසු රජය විසින් එවකට කොළඹ දිස්ත්‍රික්කයේ උතුරු ප්‍රදේශය ගම්පහ දිස්ත්‍රික්කය ලෙස නම් කරන ලදී. ඒ පරිපාලනමය තීරණයේ එක් අතුරු ඵලයක් වූයේ විශ්ව විද්‍යාල ප්‍රවේශයේ දිස්ත්‍රික් පදනම සඳහා දැන් ගම්පහ දිස්ත්‍රික්කය වෙනම ඒකකයක් ලෙස සලකා ගම්පහ දිස්ත්‍රික්කයේ සිසුන් සඳහා සෑම විශ්ව විද්‍යාල පාඨමාලාවකම අනිවාර්ය ඉඩකඩ ප්‍රමාණයක් වෙන් කෙරුණු බැවින්, ගම්පහ ප්‍රදේශයේ සිසුන්ට විශ්ව විද්‍යාලයට ඇතුළත්වීමට අවශ්‍ය ලකුණු මට්ටම කොළඹ ප්‍රදේශයට වඩා සාපේක්ෂව පහල වැටීමයි.

මේ අනුව එතැන් සිට ගම්පහ දිස්ත්‍රික්කයෙන් විශ්ව විද්‍යාලයට තේරුණු සිසුන් ප්‍රමාණය වැඩිවන්නට ඇතැයි සිතමි. ඒ සමගම, උසස් පෙළ හැදෑරීම සඳහා පමණක් ගම්පහ පාසල්වල සිට කොළඹ පාසල්වලට ඇතුළත්වන සිසුන් ප්‍රමාණය අඩු වී ගියේය. මගේ බාල සොහොයුරන් දෙදෙනා උසස් පෙළ සඳහා මා කළාක් මෙන් ගම්පහ සිට කොළඹට පාසල් මාරු නොකිරීමට මෙයද එක හේතුවක් විය.

විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා මේ දිස්ත්‍රික්ක පදනම එදා ආරම්භ කෙරුණේ ලංකාවේ අධ්‍යාපනයේ පැවති විෂමතා සමනය කිරීමට පැලැස්තර විසඳුමක් ලෙස බව පැහැදිලිය. එනමුදු, ඒ සහනයෙන් අනිසි ප්‍රයෝජන ගත්තෝ ද එමට සිටියහ. මා උසස් පෙළ හදාරන්නට ආනන්දයට ගිය දුම්රියේම විශ්ව විද්‍යාලය බලා දිනපතා ගමන් කළ සුරංජිකා අක්කා එවැන්නියකි.

සුරංජිකා උසස් පෙළ හැදෑරුවේ ප්‍රකට කොළඹ බාලිකා පාසලක ය. ඇගේ මුල්වර විභාග ප්‍රථිපල සමහර විට හොඳ තත්වයේ තියෙන්නට ඇත. නමුත් ඒ ප්‍රථිපලය විශ්ව විද්‍යාලයට පිවිසීමට ප්‍රමාණවත් නොවී තිබුණි. සුරංජිකා අක්කා කළේ දෙවනවරට විභාගය සඳහා කැකිරාව වැනි දුෂ්කර ප්‍රදේශයකින් පෙනී සිටීමයි.

ඇය එසේ කළේ, ඒ ප්‍රදේශයේ පාසලක් හරහාද, එසේ නැතහොත් පුද්ගලික විභාග අපේක්ෂිකාවක් ලෙසද මම නොදනිමි. එසේ වුවද, අය විභාගය කාලයේ සති කීපයක් කැකිරාවේ ගත කළ බවද, අනතුරුව එඩින් ඉද ප්‍රතිපල මත විශ්ව විද්‍යාලයට ඇතුළු වී විද්‍යාවේදී උපාධියක් ලබාගත් බව ද මම හොඳින් දනිමි.

පැහැදිලිවම සුරංජිකා එදා කළේ කැකිරාවේ සිසුවෙකුට හිමි විශ්ව විද්‍යාල ප්‍රස්තාව උදුරා ගැණීමකි. පසු කළෙක මේ තත්වය වැළැක්වීමට යම් යම් නීති ඇතුළත් කළද නීතියේ හිඩැස් වලින් පණින්නෝ තවමත් සිටිනැයි සිතමි.

දිස්ත්‍රික්ක පදනම සකසා තිබුණේ රටේ පවතින අධ්‍යාපන මට්ටම් විෂමතාවට පැලැස්තර විසඳුමක් ලෙස බව මම මුලින් සඳහන් කළෙමි. ඒ කරුණු කෙසේ වුවද, ඕනෑම පාඨමාලාවක් සඳහා කොළඹ දිස්ත්‍රික්කය වැනි පෙදෙසකින් විශ්ව විද්‍යාලයට ඇතුළත් වීමට අවශ්‍ය වන ලකුණු මට්ටමට සාපේක්ෂකව දුෂ්කර පලාතකින් ඇතුළත් වීමට අවශ්‍ය වන ලකුණු ප්‍රමාණය ඉතා අඩු බව අසන කොළඹ දිස්ත්‍රික්කයේ සිසුන් කුපිත වීම අපේක්ෂා කළ යුත්තකි.

16 වන පිටට